සංචාරක ව්‍යාපාරය, රජයෙන් ඉතා නොමසුරු ලෙස දුන් බදු සහන ලබා ගත් අංශයකි. 1980 වර්ෂය දක්වා මෙම අංශයේ වූ මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 888 ක් විය. ඉන් සියයට 77 ක් දේශීය ආයෝජන කොටස වූ අතර ඉතිරි සියයට 23 විදේශීය කොටස විය.

## ගෙවුම් තුලනය

ආනයනයන්ගේ අසීමිත වර්ධනය, වෙළෙඳ අනුපාතය තවදුරටත් පිරිහීම, ජංගම ගිණුමේ සහ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය තියුණු ලෙස පුළුල් වීම, විදේශ වත්කම් සැළකිය යුතු ලෙස පහත වැටීම සහ ප්‍රධාන විදේශ මුදල්වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ අගය පිරිහීම යන කරුණු 1980 වසරේ ගෙවුම් තුලන වර්ධනයන්හි ප්‍රධාන ලක්ෂණ විය.

වසර කිහිපයක් මුළුල්ලේ ඉතා අයහපත් හැසිරීමක් පෙන්නුම් කළ ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය 1977 දී යහපත් අතට හැරෙමින් එහි වෙළෙඳ භාණ්ඩ සහ ජංගම ගිණුමෙහි තරමක එහෙත් සතුටුදායක අතිරික්තයන් වාර්තා විය එතැන් සිට වෙළෙඳ භාණ්ඩ ගිණුමේ සහ ජංගම ගිණුමේ හිඟයන් නොකඩවාම වැඩිවෙමින් ගෙවුම් තුලනය නැවත වරක් අයහපත් අතට හැරුණි. 1980 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 16,140 (විගැහි දශ ලක්ෂ 750), මෙතෙක් වාර්තා වී ඇති ඉහළම හිඟය වන අතර එය මීට ඉහත වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 7,288 ක හිඟයට වඩා සැළකියයුතු පිරිහීමක් පෙන්නුම් කරයි. සේවා සහ සංක්‍රාම ගිණුම්වල, පසුගිය වසරට වඩා විශාල අතිරික්තයක් පෙන්නුම් කළද, පුළුල් වූ වෙළෙඳ භාණ්ඩ ගිණුම් හිඟය, මීට සමාන හිඟයක් පෙන්නුම් කළ ජංගම ගිණුම තුළින් පිළිබිඹු විය.

1980 දී ජංගම ගිණුමේ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 10,739 (විගැහි දශ ලක්ෂ 499) මෙතෙක් වාර්තා වූ ඉහළම හිඟය වූ අතර එය 1979 වර්ෂයේ ජංගම ගිණුම් හිඟය වූ රුපියල් දශ ලක්ෂ 3,556 (විගැහි දශ ලක්ෂ 177) සමග සැසඳේ. 1980 දී මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 7,446 (විගැහි දශ ලක්ෂ 346), මෙතෙක් එක් වසරක් තුළ ලැබුණු විශාලතම ප්‍රමාණය වුවද, ජංගම ගිණුමේ හිඟය පියවීමට මෙය ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, වසර අවසන් වන විට සමස්ත ශේෂය රුපියල් දශ ලක්ෂ 2,967 (විගැහි දශ ලක්ෂ 166) ක හිඟයක් පෙන්නුම් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචිත පහත වැටෙන්නට විය. සමස්තයක් ලෙස ගත් කළ දළ විදේශ සංචිත රුපියල් දශ ලක්ෂ 2,886 (විගැහි දශ ලක්ෂ 179) කින් සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත රුපියල් දශ ලක්ෂ 2,967 (විගැහි දශ ලක්ෂ 166) කින් අඩු විය. පිරිහෙමින් පැවති ගෙවුම් තුලන තත්ත්වය තවදුරටත් කැපී පෙන්වමින් විශේෂයෙන් වර්ෂයේ දෙවැනි භාගය තුළදී ශ්‍රී ලංකාවේ රුපියල් විනිමය අනුපාතිකය විදේශීය ප්‍රධාන ව්‍යවහාර මුදල් සමග සැළකිය යුතු මට්ටමකින් පහත වැටුණි.

සංවර්ධන වැඩ පිළිවෙලක් සඳහා යොමු වී ඇති රටක ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟයක් ඇති වීම අසාමාන්‍ය දෙයක් නොවේ. ඇත්ත වශයෙන්ම, ආර්ථිකයක් තුළට විදේශ සම්පත් ඇදගනු ලබන්නේ මෙවැනි හිඟයන් තුළිනි. මෙම අර්ථයෙන් බලන කල, 1978 සහ 1979 වසරවල වාර්තා වූ හිඟයන් අයහපත් තත්වයක් ලෙස සැළකිය නොහැකිය. ඇත්ත වශයෙන්ම, මෙම වසරවලදී විශාල විදේශ සම්පත් ප්‍රමාණයක් රැස් කර ගැනීමට රටට හැකි වූ අතර එමගින් ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමටත්, ශේෂය විදේශ වත්කම් තර කිරීමටත් දායක විය. අනෙක් අතට, 1980 ගෙවුම් තුලන වර්ධනයේ ලක්ෂණය වූයේ, විදේශීය මාර්ගවලින් රැස් කර ගන්නා ලද සම්පත් ප්‍රමාණය ජංගම ගිණුමේ කොටසක් පමණක් පියවීමට ප්‍රමාණවත් වීම නිසා, ශේෂය පියවීම සඳහා මෙතෙක් රැස් කරගෙන තිබූ විදේශ සම්පත් විශාල ප්‍රමාණයක් යොදා ගැනීමට සිදුවීමෙන් රටේ විදේශ විනිමය දුර්වල තත්ත්වයකට පත් වීමය.

1979 වසරට වඩා සියයට 12 ක් තරම් වූ තරමක වැඩිවීමක් පිළිබිඹු කරමින් 1980 දී මුළු අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 17,711 (විගැහි දශ ලක්ෂ 823) ක් විය. 1980 දී අපනයන ඉපැයීම්වල මෙම වර්ධනය, වැඩි වූ මිලයන්හි ප්‍රතිඵලය විය. ඇත්ත වශයෙන්ම, ඉකුත් වසර සමග සසඳන කල අපනයන ප්‍රමාණ දර්ශකය නොවෙනස්ව පැවති අතර, අපනයන මිළ දර්ශකයේ සියයට 15 ක තරමක වැඩිවීමක් පෙන්නුම් කෙරිණ.

## 1 · 27 සංඛ්‍යා සටහන

## 1976—1980 ගෙවුම් තුලනය – විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1976 | 1977 | 1978 | 1979 | 1980* | 1976 | 1977 | 1978 | 1979 | 1980* |
| 1· වෙළඳ භාණ්ඩ .. | – 709 | + 350 | – 2,393 | – 7,288 | – 16,140 | – 73 | + 29 | – 144 | – 362 | – 750 |
| අපනයන (නැ.වී.ස.) .. | 4,707 | 6,640 | 13,207 | 15,282 | 17,711 | 484 | 651 | 675 | 759 | 823 |
| ආනයන (මි.ර.ගැ.) .. | – 5,416 | – 6,290 | – 15,600 | – 22,570 | – 33,851 | – 557 | – 622 | – 819 | – 1,121 | – 1,573 |
| 2· සේවා .. | + 112 | + 304 | + 119 | + 740 | + 861 | + 12 | + 29 | + 6 | + 37 | + 40 |
| ලැබීම් .. | 643 | 923 | 1,942 | 2,993 | 4,605 | 66 | 89 | 99 | 149 | 214 |
| ගෙවීම් .. | – 531 | 619 | – 1,823 | – 2,253 | – 3,744 | 54 | 60 | 93 | 112 | 174 |
| 3· භාණ්ඩ හා සේවා (1+2) .. | – 597 | + 654 | – 2,274 | – 6,549 | – 15,279 | – 61 | + 58 | – 138 | – 325 | – 710 |
| 4· සංක්‍රාම .. | 547 | 612 | 1,242 | 2,993 | 4,540 | 56 | 59 | 63 | 148 | 40 |
| පෞද්ගලික .. | 56 | 122 | 342 | 754 | 2,260 | 6 | 12 | 17 | 37 | 105 |
| නිල .. | 491 | 490 | 900 | 2,239 | 2,281 | 50 | 47 | 46 | 111 | 106 |
| 5· ජංගම ගිණුම් ශේෂය .. | – 50 | + 1,266 | – 1,032 | – 3,556 | – 10,739 | – 5 | + 117 | – 75 | - 177 | – 499 |
| 6· මූල්‍ය නොවන ප්‍රාග්ධන .. | 591 | 326 | 2,600 | 3,306 | 7,446 | 61 | 32 | 133 | 164 | 346 |
| පෞද්ගලික අංශය .. | – 109 | – 127 | 145 | 874 | 4,153 | – 11 | – 12 | 8 | 43 | 193 |
| රාජ්‍ය අංශය .. | 700 | 453 | 2,455 | 2,432 | 3,293 | 72 | 44 | 125 | 121 | 153 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 659 | 602 | 2,609 | 2,432 | 3,293 | 68 | 58 | 133 | 121 | 153 |
| ලැබීම් .. | (1,244) | (1,319) | (3,680) | (3,351) | (4,326) | (128) | (127) | (188) | (167) | (201) |
| ගෙවීම් .. | (–585) | (–717) | (–1,071) | (–919) | (–1,033 | (–60) | (–69) | (–55) | (–46) | (–48 |
| කෙටි කාලීන (ශුද්ධ) .. | 41 | – 149 | – 154 | — | — | 4 | – 14 | – 8 | — | — |
| 7· රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | — | 1,680 | 344 | – 18 | + 963 | — | — | — | — | – |
| 8· වැරදීම් සහ අත්හැරීම් .. | – 10 | + 41 | – 50 | + 820 | – 895 | – 7 | 4 | 7 | 36 | – 25 |
| 9· විගැහි වෙන්කිරීම් .. | — | — | — | 241 | 258 | — | — | — | 12 | 12 |
| 10· සමස්ත ශේෂය .. | 531 | 3,313 | 1,861 | 793 | – 2,967 | 49 | 153 | 65 | 35 | – 166 |
| 11· මූල්‍ය වෙනස්වීම් (–අතිරික්තය) .. | – 531 | – 3,313 | – 1,861 | – 793 | + 2,967 | – 49 | – 153 | – 65 | – 35 | + 166 |
| ශ්‍රී ලංකා රුපියල් විගැහි (වාර්ෂික සාමාන්‍යය) පරිවර්තන කිරීමේ අනුපාතිකය .. | | | | | | 9·73 | 10·42 | 19·58 | 20·13 | 21·52 |

* තාවකාලික.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: මූල්‍ය අංශයේ සියළු ගනු දෙනු සඳහා පරිවර්තන කිරීමේ අනුපාතිකය ලෙස වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය යොදා පරිවර්තනය කොට ඇත. මූල්‍ය වෙනස්වීම් කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත. 1977 සිට ඉදිරියට සේවා අංශයේ සහ මූල්‍ය නොවන අංශයේ සියළුම ගනුදෙනුවල පරිවර්තිකයන් කාර්තු හතරේ පරිවර්තිකයන්ගේ එකතුව නියෝජනය කරන අතර, එය වාර්ෂික සාමාන්‍ය පරිවර්තන අනුපාතිකයට සමාන විය යුතු නොවේ.

DISCARDED

# ගෙවුම් තුලනය

වාර්ෂිකව





(වි හැ අ = වි ගැ හි)

ශ්‍රී ලංකා මහ බැංකුව.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




(වි හැ අ = වි ගැ හි)

ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශ ලක්ෂ 33,851 (විගැහි දශ ලක්ෂ 1 573) ක් වූ මුළු ආනයන ප්‍රමාණය, වටිනාකම අනුව 1979 ට වඩා සියයට 40 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. කලින් පෙන්නුම් කළ පරිදි, මෙම වැඩි වීමේ විශාලතම කොටසක් ආනයන මිලෙහි තියුණු ඉහළ යාම නිසා සිදු විය. 1980 දී ආනයන මිළ දර්ශකය සියයට 43 කින් වැඩි විය. 1980 දී ආනයන ප්‍රමාණයේද සැළකිය යුතු වැඩි වීමක් සටහන් කරමින් ආනයන ප්‍රමාණ දර්ශකය සියයට 13 කින් වැඩි විය ආනයන ප්‍රමාණයන්ගේ වැඩිවීම ප්‍රධාන වශයෙන් ආයෝජන භාණ්ඩ හෝ ප්‍රාග්ධන භාණ්ඩ සහ අතරමැදි භාණ්ඩවලට සීමා විය.

**1 . 28 සංඛ්‍යා සටහන**

**1979 – 1980 සේවා සහ සංක්‍රාම**

(විගැහි දශ ලක්ෂ වරහන් තුල) රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1979 | 1980 | වෙනස 1979/80 | 1979 | 1980 | වෙනස 1979/80 | 1979 | 1980 |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 445 | 725 | + 280 | 404 | 560 | +156 | + 41 | +165 |
| | (22) | (34) | (+ 12) | (20) | (26) | (+ 6) | (+ 2) | (+ 8) |
| සංචාර . | 1053 | 1,637 | + 584 | 458 | 556 | + 98 | + 595 | +1081 |
| | (52) | (76) | (+ 24) | (23) | (26) | (+ 3) | (+ 29) | (+ 50) |
| ආයෝජන ආදයම් .. | 615 | 774 | + 159 | 854 | 1,205 | +351 | − 239 | −431 |
| | (30) | (36) | (+ 6) | (42) | (56) | (+ 14) | (− 12) | (− 20) |
| 1. ලාභ සහ ලාභාංශ . | — | — | — | 98 | 237 | +130 | − 98 | −237 |
| | (—) | (—) | (—) | (5) | (11) | (+ 6) | (− 5) | (− 11) |
| 2. පොළී .. | 615 | 774 | + 159 | 756 | 968 | +212 | − 141 | −194 |
| | (30) | (36) | (+ 6) | (37) | (45) | (+ 8) | (− 7) | (− 9) |
| රජයේ වියදම් .. | 120 | 128 | + 8 | 81 | 129 | + 48 | + 39 | + 1 |
| | (6) | (6) | (—) | (4) | (6) | (+ 2) | (+ 2) | (—) |
| විවිධ සේවා .. | 760 | 1,341 | + 581 | 456 | 1294 | +836 | + 304 | + 47 |
| | (38) | (62) | (+ 24) | (23) | (60) | (+ 37) | (+ 15) | (+ 2) |
| මුළු සේවා .. | 2993 | 4,605 | +1612 | 2253 | 3,744 | +1491 | + 740 | +861 |
| | (148) | (214) | (+ 66) | (112) | (174) | (+ 62) | (+ 36) | (+ 40) |
| පෞද්ගලික සංක්‍රාම .. | 935 | 2,518 | +1585 | 181 | 258 | + 77 | + 754) | +2260 |
| | (46) | (117) | (+ 71) | (9) | (12) | (+ 3) | (+ 37) | (+105) |
| නිළ සංක්‍රාම .. | 2239 | 2,281 | + 42 | — | — | — | +2239 | +2,281 |
| | (111) | (106) | (− 5) | — | — | — | (+ 111) | (+106) |
| මුළු සංක්‍රාම .. | 3174 | 4,799 | +1645 | 181 | 258 | + 77 | +2993 | +4,541 |
| | (157) | (223) | (+ 65) | (9) | (12) | (+ 3) | (+ 148) | (+211) |
| මුළු සේවා සහ සංක්‍රාම .. | 6167 | 9,404 | + 3237 | 2434 | 4,002 | +1568 | +3732 | +5,402 |
| | (305) | (437) | (+ 132) | (121) | (186) | (+ 66) | (+ 184) | (+251) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1979 රුපියල් දශ ලක්ෂ 2,993 (විගැහි දශ ලක්ෂ 148) ක් වූ මුළු ලැබීම් 1980 දී රුපියල් දශ ලක්ෂ 4,605 (විගැහි දශ ලක්ෂ 214) ක් දක්වා වැඩි වෙමින් ගෙවුම් තුලනයේ සේවා අංශය නොකඩවා පුළුල් වීමක් පෙන්වීය. ණය ගැනීම්, ජා. මු. අ. හැර ගැනීම් සහ අනෙකුත් කෙටිකාලීන ණය ගැනීම් සඳහා ගෙවූ පොළී සහ සේවා ගාස්තු වැනි ගෙවීම් හේතුකොටගෙන 1979 දී ශුද්ධ අතිරික්තය වූ රුපියල් දශ ලක්ෂ 740 (විගැහි දශ ලක්ෂ 36) 1980 දී රුපියල් දශ ලක්ෂ 861 (විගැහි දශ ලක්ෂ 40) දක්වා ආන්තික වැඩි වීමක් පෙන්නුම් කළේය. ශුද්ධ සංක්‍රාම ලැබීම්, විශේෂයෙන් 1976 සිට පිටරට රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකිකයින් විසින් එවනු ලබන ප්‍රේෂණ ඇතුළත් පෞද්ගලික සංක්‍රාම තවදුරටත් වැඩි වෙමින්, 1980 දී පෞද්ගලික හා නිළ ශුද්ධ සංක්‍රාම අතිරික්තය රුපියල් දශ ලක්ෂ 4,540 (විගැහි දශ ලක්ෂ 211 ) දක්වා වැඩි විය. 1979 දී පැවති රුපියල් දශ ලක්ෂ 754

(විගැහි දශ ලක්ෂ 37) ක් වූ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ලැබීම් ප්‍රමාණය සියයට 184 ක වර්ධනයක් වාර්තා කරමින්, 1980 දී රුපියල් දශ ලක්ෂ 2,260 (විගැහි දශ ලක්ෂ 105) දක්වා ඉහළ නැගිණ. සේවා අංශයේ සහ පෞද්ගලික සහ නිළ සංක්‍රාම තුළින් වාර්තාවූ ශුද්ධ අතිරික්තය, ජංගම ගිණුම් හිඟය රුපියල් දශ ලක්ෂ 10,739 (විගැහි දශ ලක්ෂ 499) දක්වා අඩු කිරීමට උපකාරී විය.

1979 දී රුපියල් දශ ලක්ෂ 2,993 (විගැහි දශ ලක්ෂ 148) ක්වූ සේවාවන්ගේ මුළු ඉපයීම් ප්‍රමාණය 1980 දී සියයට 44 ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 4,605 ක් (විගැහි දශ ලක්ෂ 214) වුවත්, ගෙවුම් අංශයේ වර්ධනය රුපියල් දශ ලක්ෂ 2,253 (විගැහි දශ ලක්ෂ 112) සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 3,745 ක් (සියයට 55 ක්) දක්වා වූ ඉහළ අනුපාතයක පැවතීම නිසා එකී වර්ධනය අර්ධ වශයෙන් හිලව් විය. ලැබීම් අංශයේ ප්‍රධාන වර්ධනය ඇති වූයේ සංචාරක ව්‍යාපාර කටයුතුවලින් ලත් ඉපයුම් සහ වරාය, ප්‍රවාහණ සහ රක්ෂණ ඉපයුම් මත වන අතර ගෙවීම් අංශයේ වැඩිවීමට ප්‍රධාන හේතුන් වූයේ ණය ගැනීම්, ජා. මු. අ. හැර ගැනීම්, කෙටිකාලීන ණය ගැනීම් (ආයෝජන ආදයම් ගෙවීම්) සහ වෘත්තීය සහ ශිල්පීය සේවා ගාස්තු, ගිවිසුම් ගාස්තු, හැකියා සහ යෝජනා ක්‍රම අගැයීම් පිළිබඳව වූ අධ්‍යයන ගාස්තු ඇතුළත් විවිධ ප්‍රේෂණයන් වෙනුවෙන් ගෙවීමට සිදුවූ පොළී හා සේවා ගාස්තු ඉහළ යාමයි.

1976 වසරේ සිට පෙන්නුම් කරන ලද පරිදි, රට තුළට වූ විදේශීය ප්‍රේෂණ හෝ විදේශයන්ගෙන් ලත් පෞද්ගලික සංක්‍රාමවල ශක්තිමත් වර්ධන වේගය අඛණ්ඩව පැවතින. මෙම ප්‍රේෂණයන්ගෙන් සැළකිය යුතු කොටසක් නියෝජනය වන්නේ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින් විසින් කරන ලද සංක්‍රාම වලිනි. සාපේක්ෂ වශයෙන් බලන කල දළ පෞද්ගලික ප්‍රේෂණයන් 1976 වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 109 ක් තරම් අඩු ප්‍රමාණයක සිට 1980 වසරේදී රුපියල් දශ ලක්ෂ 2,518 ක් හෝ විගැහි දශ ලක්ෂ 117 ක් තරම් වූ වාර්තාගත ප්‍රමාණයකට ලඟා විය. මෙම ප්‍රේෂණයන්ගේ වැඩි වීමට හේතු වූයේ පුහුණු සහ අර්ධ පුහුණු සේවකයින්ගෙන් විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවන් ලබා ගැනීම හා ඔවුන්ගේ ඉපයීම් සිය රටට ප්‍රේෂණය කිරීමට පොළඹවනු පිණිස ඔවුන් වෙත පිරිනමා තිබූ දිරිගැන්වීමය. ඒ සඳහා ඔවුන් පෙළඹවීමට සලසන ලද සමහරක් පහසුකම් මෙසේය. ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් හතරක් වූ රන් පවුම්, එක්සත් ජනපද ඩොලර්, ඩොයිෂ් මාර්ක් සහ ස්විස්ටර්ලන්ත ප්‍රැන්ක් යන ඒවායින් කැමති ඕනෑම මුදල් වර්ගයකින් අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් (අ. වි. ව්‍යා. මු) ගිණුමක් පවත්වා ගැනීමේ පහසුකම; ගිණුම් හිමියා ශ්‍රී ලංකාවට ආපසු පැමිණි දින සිට තවත් වසර දහයක කාල පරිච්ඡේදයක් තුළ අ. වි. ව්‍යා. මු. ගිණුම පවත්වාගෙන යාමේ පහසුකම; එවැනි තැන්පතු සඳහා විදේශ මුදල් වලින් පොළී ගෙවීම; විදේශයන්හි නැවතී සිටින කාලය තුළදී කරන ලද තැන්පතු සම්බන්ධයෙන් සහ ගිණුම් හිමියා ශ්‍රී ලංකාවට ආපසු පැමිණි දින සිට තවත් වසර තුනක කාල පරිච්ඡේදයක් ගත වන තෙක් කරන ලද තැන්පතු ධන බද්දෙන් නිදහස් කිරීම; ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිය සඳහා ආපසු එන දිනය තෙක් අ. වි. ව්‍යා. මු. ගිණුමෙන් උපයනු ලබන පොළී ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම සහ කිසිදු බාධකයකින් තොරව අ. වි. ව්‍යා. මු. ගිණුම්වල ඇති මුදල් පාවිච්චි කිරීමට ඇති හැකියාවද වේ. සලසා ඇති තවත් පහසුකමක් නම් ආයෝජකයා සිය ඉතිරිකිරීම් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ විදේශ ව්‍යවහාර මුදල් වලින්ද යන කරුණු නොසලකා අ. වි. ව්‍යා. මු. ගිණුම්වල තැන්පත් කරුවන් බැංකු අත්තිකාරම් ලබා ගැනීමට සුදුස්සන් වීමය.

1980 වසරේ දී විදේශීය රාජ්‍යන්ගෙන් හා ආයතනයන්ගෙන් ලැබුණු නිළ සංක්‍රාම සහ ආපසු නොගෙවන ප්‍රදානයන් රුපියල් දශ ලක්ෂ 2,281 (විගැහි දශ ලක්ෂ 106) ක් වූ අතර විගැහි අනුව සසඳා බැලීමේදී 1979 වසරේ ලැබුණු විගැහි දශ ලක්ෂ 111 ට වඩා ආන්තික පිරිහීමක් එමගින් පිළිබිඹු කරයි. මෙයින් රුපියල් දශ ලක්ෂ 540 (විගැහි දශ ලක්ෂ 25) ක් ප්‍රධාන වශයෙන්, පිටි, පොහොර ද්‍රව්‍ය සහ ආහාර

ආධාර යටතේ වූ ප්‍රදානයන් වූ අතර, රුපියල් දශ ලක්ෂ 1,636 (විගැහි දශ ලක්ෂ 76) ක් යෝජනා ක්‍රම ආධාර යටතේ වූ ප්‍රදානයන් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රන් විකිණීමෙන් ලැබූ ලාභ ඇතුළත් වන අනිකුත් නිළ ආධාර ලැබීම් රුපියල් දශ ලක්ෂ 105 ( විගැහි දශ ලක්ෂ 5) ක් විය.

1979 වසරේ ශුද්ධ ලැබීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 3,306 (වි ගැ හි දශ ලක්ෂ 164) සමග සැසඳීමේදී, 1980 වසරේදී ප්‍රාග්ධන ගිණුමේ මූල්‍ය නොවන අංශයේ පෞද්ගලික සහ නිළ ප්‍රාග්ධන ශුද්ධ ලැබීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,446 (විගැහි දශ ලක්ෂ 346) ක් විය. මෙම වැඩිවීමෙන් විශාල කොටසක් විදේශීය සෘජු ආයෝජන නිසා සිදු වූ අතර මහ කොළඹ ආර්ථික කොමිසමේ (ම.කො.ආ.කො.) අධිකාරිය තුළ සිදුවූ ආයෝජන ප්‍රමාණය ප්‍රධාන වශයෙන් මෙම වර්ධනයට හේතු විය. එම ආයෝජන රුපියල් දශ ලක්ෂ 516 (විගැහි දශ ලක්ෂ 24) ක් වූ අතර නිදහස් වෙළෙඳ කලාපයෙන් පිටත කාර්මික සහ වෙළෙඳ ආයතනයන්හි කරන ලද සෘජු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 194 (විගැහි දශ ලක්ෂ 9) ක් විය. සමාලෝචනයට භාජනය වූ වසර තුළදී දැකිය හැකි තවත් ලක්ෂණයක් නම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මෙතෙක් ඇති නොවූ පරිමාණයෙන් පෞද්ගලික වාණිජමය මූල්‍ය ලැබීම් වර්ධනය වීමය. තම ව්‍යාපාර පුළුල් කිරීමේ වැඩ පිළිවෙල සඳහා වාණිජමය මූල්‍ය පහසුකම්වල පිහිට පැතූ ප්‍රධාන ආයතනයන් අතර ජාතික ගුවන් සේවය වන එයාර් ලංකා සමාගම සහ ලංකා නැව් සංස්ථාවද විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ද බොර තෙල් සහ අනිකුත් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන වියදම් වලින් සැළකිය යුතු කොටසක් පියවීම සඳහා ප්‍රතිග්‍රහණ ණය පහසුකම් ස්වරූපයෙන් වූ කෙටිකාලීන වාණිජමය ණය උපයෝගි කර ගනු ලැබිය.

1980 ජංගම ගිණුම් හිඟයේ සැහෙන කොටසක් නිළ ආධාර ලැබීම් වලින් පියවීමට හැකි විය. ප්‍රධාන වශයෙන් ද්‍රව්‍ය, ආහාර සහ යෝජනා ක්‍රම ආධාර යටතේ වූ ණය ලැබීම් හා භාරකාර අරමුදලේ ණය සහ ප්‍රථම යුරෝපීය ඩොලර් ණය යටතේ ලබා ගත් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 50 (ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 897) ඇතුළුව නිළ ප්‍රාග්ධන යටතේ වූ දළ ලැබීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,325 (විගැහි දශ ලක්ෂ 201) ක් විය.

නිල ආධාර ලැබීම්වල සැලකිය යුතු ලක්ෂණයක් වූයේ 1979 ආධාර ලැබීම්වලට වඩා 1980 වර්ෂය ආරම්භයේදී ආධාර ලැබුණු ප්‍රමාණය ඉහල මට්ටමක පැවතීමයි. ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 643 ක්වූ එම ආධාර ලැබීම් ප්‍රමාණය එක් වර්ෂයක් තුල ලැබුණු ඉහල ම ආධාර ප්‍රමාණය විය. එහෙත් නියත ආධාර උපයෝගි කරනය අනුව බලන විට 1979 දී එය විගැහි දශ ලක්ෂ 132 ක් වූ අතර, 1980 දී විගැහි දශ ලක්ෂ 125 (රුපියල් දශ ලක්ෂ 2690) ක් දක්වා පහත වැටුනි.

ආධාර සඳහා වන ලැබීම් හැරුණුවිට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් පවත්වන ලද රන් වෙන්දේසි වලින් ලද ලාභ බෙදීමෙන් ලත් භාරකාර අරමුදල් ණය රුපියල් දශ ලක්ෂ 538 (විගැහි දශ ලක්ෂ 25) ක්ද, අනෙක් නිළ ප්‍රාග්ධන ලැබීම්වලට ඇතුළත් විය. 1979 අගෝස්තු මාසයේදී ගිවිසගත් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 50 ක් වූ යුරෝපීය ඩොලර් ණය මුදලද 1980 වසරේ අග භාගය තුළදී ලබා ගන්නා ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කළ ගනුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන් 1980 වසර තුළදී විගැහි දශ ලක්ෂ 30 (රුපියල් දශ ලක්ෂ 630) ක මිළදී ගැනීමද, විගැහි දශ ලක්ෂ 43 (රුපියල් දශ ලක්ෂ 749) ක් නැවත මිළදී ගැනීමද විය. 1980 ජූනි මාසයේදී ලබාගන්නා ලද විගැහි දශ ලක්ෂ 30 ක ණය මුදල දික්කළ ගැනුම් පහසුකම් ක්‍රමය යටතේ අරමුදල මගින් දුනට සලසා ඇති ණය පහසුකම් මත ලැබුන තුන්වැනි වාරිකය විය. සිව්වැනි පදනම් කාලය වෙනුවෙන් විගැහි වෙන් කිරීම් වශයෙන් අරමුදල මගින් දෙනු ලැබූ රුපියල් දශ ලක්ෂ 258 (විගැහි දශ ලක්ෂ 12) ට සමාන විගැහි ප්‍රමාණයක්ද වසර ආරම්භයේදී ලැබිණි.

1980 වසරේදී ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්වල ශුද්ධ වශයෙන් මෙන්ම දළ වශයෙන්ද තියුණු පහත වැටීමක් වාර්තා විය. දළ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 2,886 (විගැහි දශ ලක්ෂ 179) කින් පහත වැටුණි. මෙය 1975 වසරට පසුව විදේශීය වත්කම්වල අඩු වීමක් වාර්තා වූ පළමු අවස්ථාව විය. වසර ආරම්භයේදී දළ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 9,652 (විගැහි දශ ලක්ෂ 475) ක තරම් වූ ඉතා ඉහළ මට්ටමක පැවතුනද වසර අග වන විට එය රුපියල් දශ ලක්ෂ 6,766 (විගැහි දශ ලක්ෂ 296) ක් දක්වා පහළ වැටුණි. වසර ආරම්භයේදී පැවති දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1980 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද ආනයන වියදම්වලින් මාස 3 1/2 ක වියදම් පියවීමට ප්‍රමාණවත් වූ නමුත්, වසර අවසානයේදී පැවති දළ සංචිත ප්‍රමාණය මාස 2 ක ආනයන වියදම් පියවීමට පමණක් ප්‍රමාණවත් විය. 1981 වසර සඳහා සැළසුම් කරන ලද ආනයන වියදම් පියවීමට තිබෙන සම්පත් කෙතෙක් දුරට ප්‍රමාණවත් වේද යන්න විමසන විට විදේශීය විනිමය තත්ත්වයේ ඇති බැරෑරුම්කම වඩාත් කැපී පෙනෙනු ඇත.

**1 · 29 සංඛ්‍යා සටහන**

**1978 — 1980 විදේශ සම්පත් පරතරය පියවීම**

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 |
| 1· විදේශීය ඉපැයීම් | 15,709 | 19,210 | 24,830 | 805 | 954 | 1,154 |
| 1·1 අපනයන | 13,207 | 15,282 | 17,711 | 675 | 759 | 823 |
| 1·2 සේවා | 1,942 | 2,993 | 4,605 | 99 | 149 | 214 |
| 1·3 පෞද්ගලික සංක්‍රාම | 610 | 935 | 2,514 | 31 | 46 | 117 |
| 2· විදේශීය ගෙවීම් | 19,807 | 26,765 | 42,501 | 1,035 | 1,330 | 2,004 |
| 2·1 ආනයන | 15,600 | 22,570 | 33,851 | 819 | 1,121 | 1,573 |
| 2·2 සේවා | 1,823 | 2,253 | 3,745 | 93 | 112 | 174 |
| 2·3 පෞද්ගලික සංක්‍රාම | 268 | 182 | 248 | 14 | 9 | 12 |
| 2·4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් | 2,116 | 1,760 | 4,657 | 109 | 88 | 245 |
| 3· විදේශ සම්පත් පරතරය | − 4,048 | − 7,555 | −17,671 | − 230 | − 375 | − 850 |
| 4· සම්පත් පරතරය පියවීම | + 4,048 | + 7,555 | +17,671 | + 230 | + 375 | + 850 |
| 4·1 දිගුකාලීන ණය (අ) | 3,680 | 2,903 | 4,143 | 188 | 144 | 193 |
| 4·2 ප්‍රදානයන් | 900 | 2,239 | 2,281 | 46 | 111 | 106 |
| 4·3 සැපයුම්කරුවන්ගේ ණය | 8 | 609 | 1,173 | — | 30 | 55 |
| 4·4 කෙටිකාලීන ණය | 114 | 41 | 4,820 | 6 | 2 | 224 |
| 4·5 බැංකු ණය ගැනීම් | — | — | 361 | — | — | 16 |
| 4·6 ද්විපාර්ශ්වික ශේෂ | — | 413 | — | — | 20 | — |
| 4·7 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගැනීම් | 756 | 1,834 | 622 | 38 | 91 | 30 |
| 4·8 සෘජු ආයෝජන | 23 | 769 | 753 | 1 | 46 | 35 |
| 4·9 විදේශ වත්කම් | − 1,904 | − 2,175 | 2,886 | − 65 | − 107 | 179 |
| 4·10 විගැහි වෙන්කිරීම් | — | 242 | 258 | — | 12 | 12 |
| 4·11 වෙනත් | 177 | 120 | 147 | 9 | 6 | 5 |
| 5· රුපියල් අගය පිළිබඳ ගැළපිලි (ආ) | 344 | − 18 | 919 | — | — | — |
| 6· වැරදීම් හා අත්හැරීම් | − 50 | + 820 | − 700 | + 7 | + 35 | − 4 |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1980 වේ යෝජනාක්‍රම සහ ද්‍රව්‍ය ආධාර, භාරකාර අරමුදල් ණය සහ යුරෝ-ඩොලර් ණය ගැනීම් වලින් සමන්විතය.

(ආ) විනිමය අනුපාතික වෙනස්වීම අනුව සිදු කරන ලද ගැලපීම් වලින් පසුව විදේශ සම්පත්වල රුපියල් අගය.

# විනිමය අනුපාතික

1977 නොවැම්බර් 16 දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම




(වි හැ අ = වි ගැ හි)

ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 වසරේදී සිදු වූ තවත් සැළකිය යුතු වර්ධනයක් නම් අනෙකුත් සියළුම ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් සමඟ, විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුපාතික උපුටා දක්වනු ලබන ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග හය සමග, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස පහත වැටීමය. ශ්‍රී ලංකා රුපියලේ අගය, රන් පවුමට ප්‍රතිමුඛව සියයට 19.6 කින් ද එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 13.9 කින්ද, ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 25.3 කින්ද, ඩොයිෂ් මාර්ක්වලට ප්‍රතිමුඛව සියයට 2.6 කින්ද, ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව සියයට 3.0 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 15·4 කින්ද පහත වැටුණි. විශේෂ ගැනුම් හිමිකම් (විගැහි) අනුව අගය කරන විට ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 10.8 කින් පහත වැටුණි.

**විදේශීය ණය සහ සේවාකරණය**

1979 දී ඇති වූ සියයට 6 ක වැඩිවීම සමඟ සසඳා බලන කල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ හැර ගැනීම්, විදේශීය රට වලින් ලබා ගත් ණය සහ රාජ්‍ය අංශයේ සැපයුම් කරුවන්ගේ ණයද ඇතුළුව නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15,841 (විගැහි දශ ලක්ෂ 778) සිට රුපියල් දශ ලක්ෂ 22,596 (විගැහි දශ ලක්ෂ 987) දක්වා සියයට 27 කින් 1980 වසර තුළදී වැඩි විය. ද්‍රව්‍ය සහ යෝජනා ක්‍රම ණය, භාරකාර අරමුදල් ණය, එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 50 (රුපියල් දශ ලක්ෂ 897) ක් වූ යුරෝපීය ඩොලර් ණය සහ දිගුකාලීන ණය ගැනීම්, නොපියවූ ණය ප්‍රමාණයේ වර්ධනයට ප්‍රධාන හේතුව විය. 1979 දී රුපියල් දශ ලක්ෂ 69 (විගැහි දශ ලක්ෂ 4) ක් වූ විදේශීය බැංකු වලින් ලබා ගත් ණය ප්‍රමාණයද, 1980 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 429 (විගැහි දශ ලක්ෂ 19) දක්වා ඉහළ නැගුණි. අනිත් අතට රාජ්‍ය අංශයේ සැපයුම් කරුවන්ගේ ණය වෙනුවෙන් නොපිය වූ ණය ප්‍රමාණය වසර තුළදී පහළ වැටුණි.

සියළුම දිගුකාලීන විදේශීය ණය, සැපයුම් කරුවන්ගේ ණය සහ ජා. මූ. අරමුදලෙන් නැවත මිලදී ගැනීම් (ආපසු ගෙවීම්) හා සේවා ගාස්තු යනාදිය වෙනුවෙන් වූ ප්‍රාග්ධන ගෙවීම් සහ පොළී ගෙවීම් ඇතුළත් මුළු ණය ආපසු ගෙවීම් ප්‍රමාණය 1979 දී රුපියල් දශ ලක්ෂ 2,383 (විගැහි දශ ලක්ෂ 118) සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 2,763 (විගැහි දශ ලක්ෂ 137) දක්වා ඉහළ නැංගේය. ණය ආපසු ගෙවීම් මෙලෙස සියයට 16 කින් වැඩිවී තිබියදීත්, 1979 දී සියයට 13·0 ක්වූ ණය සේවා අනුපාතය 1980 දී සියයට 12·4 දක්වා පහළ වැටුණි. මෙයට හේතුවූයේ දළ විදේශීය විනිමය ඉපයීම් ප්‍රමාණය සියයට 14 ක වැඩිවීමක් පිළිබිඹු කරමින්, 1979 වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 18,275 (විගැහි දශ ලක්ෂ 908) සමග සසඳන කල 1980 දී වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 22,316 (විගැහි දශ ලක්ෂ 1,037) දක්වා ඉහළ නැගීමයි. 1980 වසරේ ණය සේවා අනුපාතය පහළ වැටීමට හේතු වූ තවත් ප්‍රධාන සාධකයක් වූයේ ආනයනයන් සඳහා මුදල් සැපයීමේ මාර්ගයක් වශයෙන් කෙටිකාලීන වෙළෙඳ ණය ලබා ගැනීම නැවත ආරම්භ වීමයි. 1980 වසරේ ඛනිජ තෙල් ආනයනයන්ගෙන් සැළකිය යුතු කොටසක් වෙනුවෙන් මුදල් සපයා ගන්නා ලද්දේ කෙටිකාලීන වෙළඳ ණය මගිනි. ණය ආපසු ගෙවීම් යටතේ මේවා සටහන් වී නොමැත්තේ ඇත්ත වශයෙන්ම, එම ණය ඉතාමත් කෙටිකාලීන ස්වරූපයක් ඉසිලූ බැවිනි. මෙයට තවත් හේතුවක් වී ඇත්තේ මෑත අතීතයේදී ගිවිස ගත් දිගුකාලීන රාජ්‍ය ණය, දීර්ඝ අනුග්‍රහ කාලයක් සහිත වඩා සහනදායී කොන්දේසි මත ලැබුනු ණය වීමයි.

## 1 · 30 සංඛ්‍යා සටහන

## නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය (අ) සහ ණය සේවා ගෙවීම් 1975–1980(ආ)

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| වර්ගය | 1976 | 1977 | 1978 | 1979(ඇ) | 1980(ඈ) |
|---|---|---|---|---|---|
| 1· දිගුකාලීන ණය (ඉ) .. | 4,967·8<br>(484·4) | 10,593·5<br>(560·5) | 14,811·3<br>(732·1) | 15,840·6<br>(778·0) | 22,596·0<br>(986·7) |
| 2· සැපයුම් කරුවන්ගේ ණය .. | 632·8<br>(61·7) | 963·2<br>(51·0) | 991·4<br>(49·0) | 828·6<br>(40·7) | 787·6<br>(36·6) |
| 3· ජා·මු·අ· ගැනීම් .. | 916·5<br>(89·4) | 1,212·3<br>(64·1) | 1,548·2<br>(79·4) | 2,501·3<br>(126·2) | 2,335·1<br>(112·6) |
| 4· බැංකු ණය ගැනීම් .. | 308·9<br>(30·1) | 552·3<br>(29·2) | 155·1<br>(7·7) | 69·1<br>(3·4) | 428·6<br>(18·7) |
| නොගෙවා ඇති මුළු ණය (ආ) .. | 6,826·0<br>(665·6) | 13,321·3<br>(704·8) | 17,506·0<br>(878·2) | 19,239·6<br>(948·3) | 26,147·3<br>(1,154·6) |
| 1· ණය සේවා ගෙවීම් .. | 1,073·5<br>(110·3) | 1,211·9<br>(116·3) | 2,347·2<br>(119·8) | 2,383·1<br>(118·4) | 2,762·8<br>(137·0) |
| 1·1 ණය ආපසු ගෙවීම් .. | 883·5<br>(90·8) | 966·9<br>(92 8) | 1,862·4<br>(95·1) | 1,627·4<br>(80·8) | 1,781·5<br>(91·4) |
| (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට) .. | 189·9<br>(19·5) | 219·2<br>(21·0) | 440·4<br>(22·5) | 622·6<br>(30·9) | 748·5<br>(43·4) |
| 1·2 පොළී .. | 190·0<br>(19·5) | 245·0<br>(23·5) | 484·8<br>(24·7) | 755·7<br>(37·5) | 981·3<br>(45·6) |
| (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට) .. | 67·5<br>(6·9) | 73·2<br>(7·0) | 154·4<br>(7·9) | 170·0<br>(8·4) | 345·6<br>(12·4) |
| 2· වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපැයුම් .. | 5,349·9<br>(550·0) | 7,563·2<br>(725·8) | 15,148·8<br>(773·7) | 18,274·7<br>(907·7) | 22,316·3<br>(1,037·0) |
| 3· ණය සේවා අනුපාතිකය (1,2හි ප්‍රතිශතයක් වශයෙන්) .. | 20·1 | 16·0 | 15·5 | 13·0 | 12·4 |
| 4· ණය සේවා අනුපාතිකය (ජා.මු.අ. ගනුදෙනු හැර) .. | 15·3 | 12·2 | 11·6 | 8·7 | 7·5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) කෙටිකාලීන වෙළෙඳ ණය හැර

(ආ) නොගෙවා ඉතිරිව ඇති විදේශීය ණය දත්ත, කාලච්ඡේදය අවසානයේ වූ අනුපාතිකයන් අනුව පරිවර්තනය කර ඇති අතර ණය සේවා කරණ ගෙවීම් සහ වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවා ඉපයීම් පිළිබඳ දත්ත පරිවර්තනය කිරීම සඳහා සාමාන්‍ය අනුපාතිකයන් යොදා ඇත.

(ඇ) සංශෝධිතයි.

(ඈ) තාවකාලික

(ඉ) භාණ්ඩ ණය, යෝජනා ක්‍රම ණය, භාරකාර අරමුදලේ ණය සහ 1980 දී ලබාගත් යුරෝ ඩොලර් ණය ඇතුළු වෙනත් ණය වලින් සමන්විතය.